# 8 අලුත් නිවහනක්

රාජා වයස අවුරුදු දහයක ළමයෙක්. රාජලාට පහසුකම් ඕන තරං තිබුණා. රාජාට කිසි ම දෙයක් අඩු නැහැ. රාජාට ලස්සන ගෙයක් තිබුණා. ඒ ගෙදර රාජාගෙ අම්මයි, තාත්තයි, ආච්චියි හිටියා.



රාජාත්, ගෙදර අයත් හැම වෙලාවෙ ම බොහො ම සතුටින් හිටියා. ආච්චිත් හිටියේ හරි ම සතුටින්. තාත්තයි, අම්මයි දෙන්නා ම ආච්චිට හොඳට සලකනවා, ගරු කරනවා; රැකබලා ගන්නවා; උපස්ථාන කරනවා. " අපේ අම්මලා නං හරි ම හොඳයි" කියලා රාජාට හිතුණා.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



ඒවගේ ම ආච්චිත් හරි ම හොඳයි. හැමදා ම රාජාත් එක්කරගෙන බුදුන් වඳිනවා; පෝයදාට සිල් සමාදන් වෙනවා; රාජාට කතන්දර එහෙමත් කියලා දෙනවා; ලස්සන කවිත් කියලා දෙනවා. ඉතින් රාජා නං ආච්චි නිසා හරි සතුටෙන් හිටියා. ඒ වගේ ම හොඳ දේවල් ගොඩාක් ඉගෙන ගත්තා.



එක් දවසක් හතර දෙනා ම කෑම මේසෙට ගියා. රෑ කෑම කන්න සූදානම් වුණා. එවේලෙ එකපාරට ම විදුලියක් කෙටුවා. ඊළඟට හයියෙන් ගෙරෙව්වා. හවස තිබුණ පොද වැස්ස මහ වැස්සක් වුණා. ටික වෙලාවක් හයියෙන් වැස්සා. රාජාට ටිකක් බය හිතුණා.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

එවෙලෙ කවුද දොරට ගහනවා ඇහුණා. අම්මයි, තාත්තයි දොර ළඟට ගියා. රාජාත් එතනට ගියා දොර ළඟ දී රාජා දැක්කේ ජේන් ආච්චි. ජේන් ආච්චි ඉන්නේ රබර් වත්තේ. රබර් වත්තේ තියෙන පුංචි පැලේ. ඉස්සර ජේන් ආච්චි අපේ ගෙදර එනවා. රාජාට ඒවා මතක් වුණා.



"නෝනා, මහ වැස්සට මගේ පැල කඩා වැටුණා."

එහෙම කියලා ජේන් ආච්චි ඉකි බිඳිමින් ඇඬුවා.

"එන්න ජේන් අම්මේ ගෙට." කියලා අම්මයි තාත්තයි කතා කළා. ලොකු කරුණාවක් ඒ වචනවල තිබුණා. එවෙලෙ රාජාට අම්මා, තාත්තා ගැන දැනුණේ ලොකු ආදරයක්.

අම්මා ජේන් ආච්චිට ඇඳුමක් දුන්නා. ඊළඟට පස්දෙනා ම එකට කෑම කෑවා. ජේන් ආච්චි අපේ ආච්චිගෙ කාමරේ නිදාගත්තා.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

"ජේන් ආච්චි ඉන්න ටිකේ හොඳට සලකන්න ඕනෑ." කියලා අම්මයි, තාත්තයි කතා වෙනවා රාජාට ඇහුණා.

පසුව දා උදේ රාජා පාසල් යන්න ලෑහැස්ති වුණා. යන්න ඉස්සර රාජා අම්මටයි, තාත්තටයි දණ ගහලා වැන්දා. ඊළඟට ආච්චිගෙ කාමරේට ගියා. ආච්චිටයි, ජේන් ආච්චිටයි දණ ගහලා වැන්දා. "ජේන් ආච්චි අලුත් ගේ හොඳ ද?" කියලා රාජා හිනාවෙලා ඇහුවා. "හොඳයි පුතේ" කියලා ජේන් ආච්චි හිනාවෙලා කිව්වා.



ආච්චිලා දෙන්නා ම "පුතාට බුදුසරණයි" කිව්වා. රාජාගෙ හිතට ලොකු සතුටක් දැනුණා.

රාජා මිදුලට බැහැලා සතුටින් පාසල් යන්න පිටත් වුණා.

## ක්‍රියාකාරකම 1

(i) පාඩම නිශ්ශබ්ද ව කියවන්න. ඉන්පසු හඬ නගා කියවන්න.

(ii) මේ කතාව අසන විට රාජාගේ ගෙදර අය ගැන ඔබට හිතෙන දේ කියන්න.

(iii) මේ කතාවේ ඔබ සිත්ගත් අවස්ථාවක් කියන්න.

## ක්‍රියාකාරකම 2

පහත වැකි හරි නම් (✓) ලකුණු ද වැරදි

නම් (×) ලකුණ ද යොදන්න.

උදාහරණය:- රාජා අවුරුදු අටක ළමයෙක්. (× )

(i) රාජාගේ අම්මයි, තාත්තයි ආච්චිට සැලකුවා. ( )

(ii) ආච්චි රාජාට කතන්දර කියා දුන්නා. ( )

(iii) ජෝන් ආතා රාජාගෙ ගෙදරට ආවා. ( )

(iv) ජේන් ආච්චි ඉකි බිඳිමින් ඇඬුවා. ( )

(v) රාජා දුකෙන් පාසල් යන්න පිටත් වුණා. ( )



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 3

පාඩමේ සඳහන් පහත දැක්වෙන පද හඳුනාගන්න. ඒවායේ තේරුම විමසා දැනගන්න.

ටිකේ

එවෙලෙ

ඊළඟට

ඉස්සර

මේ පද සහිත වැකි පාඩමෙන් සොයා ලියන්න.

| | |
|---|---|
| ඊළඟට | ................................. |
| එවෙලෙ | ................................. |
| ඉස්සර | ................................. |
| ටිකේ | ................................. |

## ක්‍රියාකාරකම 4

වරහන තුළ ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.

(i) මේ....................................... මම පාසල් ගියේ නැහැ.

(ii) ................................. අපට හරි ම අවිවේකයි.

(iii) .................................... ට අපි සෙල්ලම් කරනවා.

(iv) ................................ අම්මා මට තෑග්ගක් දුන්නා.

(v) ගේ.................. මම දුවන්න පටන් ගත්තා.

(එවෙලෙ, ඉස්සර, ටිකේ, ළඟ දී, ඊළඟට)

## ක්‍රියාකාරකම 5

**ලස්සන** ගෙයක්

**මහ** වැස්සක්

තද කළු අකුරෙන් ඇති පදවලින් අනෙක් පදය විස්තර කරනවා. එවැනි පද වැකිවල යෙදෙන හැටි බලන්න.

**ලස්සන** ගෙයක් තිබුණා.

පොද වැස්ස **මහ** වැස්සක් වුණා.

දැන් අපට **අලුත්** ගෙයක් තියෙනවා.

පාඩමේ සඳහන් එවැනි පද සහිත වැකි සොයා ලියන්න.

## ක්‍රියාකාරකම 6

(ආ) තීරුවේ හිස්තැනට සුදුසු පද (අ) තීරුවෙන් සොයා එම වැකි අභ්‍යාස පොතේ ලියන්න.

| (අ) | (ආ) |
| --- | --- |
| (i) කඩිසර | (i) ...................... ආහාර ශරීරයට අහිතකර වෙනවා. |
| (ii) නපුරු | (ii) ...................... සේවකයෝ එහි වැඩ කරනවා. |
| (iii) දිරාගිය | (iii) ...................... මැණික් බබළනවා. |
| (iv) කරුණාවන්ත | (iv) ...................... මිනිසාට මම බය වුණා. |
| (v) පරණ | (v) ...................... බල්ලා සොරා පස්සේ දුවනවා. |
| (vi) පුහුණු | (vi) ...................... ළමයා හොඳින් වැඩ කළා. |
| (vii) පිළුණු | (vii) ...................... ගෙය කඩා වැටුණා. |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(viii) වටිනා

(viii) ............................ මුදලාලි කඩයේ ඉන්නවා.

(ix) කළු

(ix) ............................ ආච්චි මට උදව් කරනවා.

(x) මහත

(x) ............................... ඇඳුම ඉරිලා ගියා.

## ක්‍රියාකාරකම 7

පහත වැකිවලට සුදුසු පද වරහනින් තෝරා ලියන්න.

(i) අම්මා ____________________ කෑමක් සෑදුවා.

(ii) ගුරුවරයා දරුවන්ට____________ කතා කියා දෙනවා.

(iii) සමහර ළමයි___________________අඹ කනවා.

(iv) ________________ නංගී හයියෙන් අඬනවා.

(v) ____________දරුවා විභාගය සමත් වුණා.

(vi) ඔහු_____________________මිනිසෙකු ව හිටියා.

(vii) අපි_________________ පලතුරු කනවා.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(viii) ______________ මිනිසා බිම නිදා ගන්නවා.

(ix) ආච්චි ______________ මල් පූජා කරනවා.

(x) ළමයා ______________ ළිඳට එබී බැලුවා.

(ලස්සන, ගැඹුරු, අසරණ, සුදු, අමු, රස, දක්ෂ, ඉදුණු, අලුත්, පොඩි, දුප්පත්, එඩිතර, සුවඳ)

## ක්‍රියාකාරකම 8

අ. පහත සඳහන් වැකි කියවා වෙනස අවබෝධ කර ගන්න.

(i) අ. අපේ අම්මලා හරි ම හොඳයි.

ආ. අපේ අම්මලා නං හරි ම හොඳයි.

(ii) අ. රාජා හරි සතුටෙන් හිටියා.

ආ. රාජා නං හරි සතුටෙන් හිටියා.

ආ. පහත සඳහන් වැකිවල සුදුසු තැනට “නං” යොදා කියන්න.

(i) මම නරක වැඩ කරන්නෙ නෑ.

(ii) අපේ තාත්තා මස්, මාළු කන්නෙ නෑ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(iii) අපේ අම්මා රසට උයනවා.

(iv) අපේ සිංහල පන්තිය හරි ම හොඳයි.

(v) එයා පොහොසත් පවුලක ළමයෙක් නො වෙයි.

## ක්‍රියාකාරකම 9

පහත සඳහන් වැකි දෙක කියවා තේරුම් ගන්න.

- රාජා පොහොසත්. රාජා අහංකාර නෑ.
- රාජා පොහොසත්. ඒ උනාට අහංකාර නෑ.

මේ ලෙස "**ඒ උනාට**" යොදා පහත සඳහන් වාක්‍ය ගළපන්න.

(i) එයාලට පහසුකම් තියෙනවා. එයාලා හොඳට ඉගෙන ගන්නේ නෑ.

(ii) මම එයාට සල්ලි දුන්නා. එයා ගත්තේ නෑ.

(iii) රංජිට කවුරුවත් උදව් කළේ නෑ. රංජි හොඳට ඉගෙන ගත්තා.

(iv) එයා හොඳට හම්බ කළා. නෑයන්ට සැලකුවේ නෑ.

(v) එයාලා දුප්පත්. එයාලා ගුණ යහපත් මිනිස්සු.

## ක්‍රියාකාරකම 10

(i) ඔබ දන්නා කතන්දර කිහිපයක් පන්තිය ඉදිරියේ කියන්න.

(ii) කම්මැළි, කපටි, කීකරු, කරුණාවන්ත, පළල මේ පද තවත් ගැළපෙන පදයක් සමග යොදා වැකි ලියන්න.